# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2476/21 - 2026 පෙබරවාරි මස 18 වැනි බදාදා - 2026.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ**
**දැරණියගල ප්‍රාදේශීය සභාවේ**
**සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන දැරණියගල ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ දැරණියගල ප්‍රාදේශීය සභාවේ අංක 12 දික්ඇල්ලකන්ද කොට්ඨාසයට තේරීපත් වූ විතාන කුරුප්පු ආරච්චිලාගේ රංජිත් කුරුප්පු අයත් වන්නා වූ සමගි ජන බලවේගය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම දැරණියගල ප්‍රාදේශීය සභාවේ අංක 12 දික්ඇල්ලකන්ද කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා රාමන් විග්නේස්වරරාජා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

දැරණියගල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි කරුණාතිලක රාලහාමිලාගේ වසුන්දරා එරන්දි දිසානායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් රාමන් විග්නේස්වරරාජා දැරණියගල ප්‍රාදේශීය සභවේ අංක 12 දික්ඇල්ලකන්ද කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**කේ. ආර්. වසුන්දරා ඊ. දිසානායක,**
තේරීම්භාර නිලධාරි,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2026 පෙබරවාරි මස 18 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කෑගල්ල.

EOG 02 - 0151

1A - PG 7531 — 09 (2026/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*